# මුදල් අමාත්‍යාංශය

## රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) ලේකම් කාර්යාලය ,

# නිලධාරීන් බඳවාගැනීම

මුදල් අමාත්‍යාංශයෙහි, රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) ලේකම් කාර්යාලයෙහි පහත සඳහන් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීමට සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ප්‍රසම්පාදන විශේෂඥ - තනතුරු 01

**මාසික වැටුප :**

රු. 100,000/- (සියලු දීමනා සහිතව)

**වයස් සීමාව :**

අවුරුදු 65 ට අඩු

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ ඊ හා සමාන වෙනත් උපාධි සුදුසුකමක්. **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ විෂය ක්ෂේත්‍රයේ සමාන සුදුසුකමක්. **සමග**

කළමනාකරණ මට්ටමින් අවම වශයෙන් අවුරුදු 06 ක සුදුසුකම් තිබීම.

(දේශීය / විදේශීය) අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල පළපුරුද්ද සමග රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරීන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

මූලික සුදුසුකම් සහ පළපුරුද්ද සහිත තෝරාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**බඳවාගැනීමේ පදනම :**

වසරක කාලයක් කොන්ත්‍රාත් පදනම මත

## කොන්දේසි :

වසරක කාලයක් සඳහා සිදුකරනු ලබන පත්වීම් ප්‍රදානයෙන් අනතුරුව එම කාලය ඉක්මවා ගියපසු කාර්ය සාධනය අනුව සේවා කාලය දීර්ඝ කරනු ලැබේ. (සියලු කොන්දේසි 2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ පත්වීම් සම්බන්ධව වූ ඉන්පසු නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව වේ)

අයදුම්පත් අධ්‍යාපන සහ වෘත්තීමය පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට 2021 මාර්තු 05 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

**අධ්‍යක්ෂ**
**රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය**
**දෙවන මහල, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01.**

**විද්‍යුත් ලිපිනය : egphr@promise.lk**

අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

විද්‍යුත් ලිපිනයට එවනු ලබන අයදුම්පත්හි විද්‍යුත් ලිපිනයේ මාතෘකාව ලෙස අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ**
**රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය**
17.02.2021